කොළඹ විශ්වවිද්‍යාලය

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය (විශේෂ) - සිව්වන වසර

සෙමෙස්තර අවසාන පරීක්ෂණය - පළමු සෙමෙස්තරය - 2018/2019

**DMG 4179 : නාගරික සැලසුම් සහ ප්‍රතිපත්ති සඳහා ප්‍රජාවිද්‍යාව**

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න කාලය: පැය දෙකයි (02)

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ

---

1.අ) රටක නාගරික ජනගහන ගතිකයන් විශ්ලේෂණයේදී යොදාගත හැකි දත්ත මූලාශ්‍ර උදාහරණ සපයමින් විස්තර කරන්න.

(ලකුණු 05)

ආ) විවිධ රටවල් අතර නාගරික ප්‍රජාවිද්‍යා දත්ත සංසන්දනයේදී ඔබ නිරීක්ෂණය කළ ගැටලු විශ්ලේෂණය කරන්න.

(ලකුණු 15)

2.අ) සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින රටවල ප්‍රජාවිද්‍යා සංක්‍රාන්තිය සහ නාගරික ජන සංක්‍රාන්තිය අතර සබඳතාව සම්බන්ධයෙන් ඔබ නිරීක්ෂණය කළ මූලික රටා සහ ගති ලක්ෂණ උදාහරණ දක්වමින් විමසන්න.

(ලකුණු 08)

ආ) නාගරික ජන සංක්‍රාන්තිය මඟින් ඇතිවන සමාජ, ආර්ථික ගැටලු සුදුසු උදාහරණ දක්වමින් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 12)

3. සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින රටවල විවිධ නාගරික සැලසුම් ආකෘති විමසමින් එම නාගරික සැලසුම් ආකෘති මඟින් සමාජ සහ ප්‍රජාවිද්‍යාත්මක ගැටලු ආමන්ත්‍රණය කර ඇති ආකාරය විස්තර කරන්න.

(ලකුණු 20)

4. තිරසාර සංවර්ධන 11 වන ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට අදාළව ශ්‍රී ලංකාවේ නාගරික සැලසුම් සඳහා වැදගත් වේ යැයි සැලකිය හැකි ප්‍රජාවිද්‍යාත්මක සාධක විමසන්න.

(ලකුණු 20)

5. ශ්‍රී ලංකාවට විශේෂ අවධානය යොමු කරමින් පහත සඳහන් නාගරික ජනගහන ගැටලු උදාහරණ සමඟින් විස්තර කරන්න.

අ ) නාගරික නිවාස අවශ්‍යතාව

ආ) නාගරීකරණයේ අවධි

ඇ) නාගරික පාලනය

ඈ) නාගරික ජනගහන ගතිකයන්

(5x4= ලකුණු 20)